මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව |
| දිනය | 2022 පෙබරවාරි 15 |

# ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සෘජු නිකුතුව ඔස්සේ රැස් කළ අරමුදල්

ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර තුළ ආයෝජන දිරිමත් කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දෙන ලදී. එම ක්‍රියාවන්හි සාර්ථකත්වය පෙන්නුම් කරමින් 2022 ජනවාරි මස 01 වනදා සිට පෙබරවාරි මස 15 වනදා වනවිට එක්සත් ජනපද ඩොලර් මිලියන 111.5ක අරමුදලක් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සෘජු නිකුතුව ඔස්සේ රැස් කර ගැනීමට හැකි විය.

ඉහත සඳහන් කළ කාලය තුළ සිදු කළ ආයෝජනයන්හි පරිණත කාලයන් මාස 3 සිට වසර 5 දක්වා කාල පරාසයක විහිදුණු අතර, කුඩා පරිමාණ මෙන්ම මහා පරිමාණ සුදුසුකම් ලත් ආයෝජකයන් ආයෝජනය කිරීමට පෙළඹුණි. විදේශයන්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලවල සහයෝගය ඇතිව ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර තුළ ආයෝජනය කිරීමට, ඒ සඳහා සුදුසුකම් ලත් ආයෝජකයින් දිරි ගැන්වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කරමින් සිටියි.